# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2071/18 - 2018 මැයි මස 15 වැනි අඟහරුවාදා - 2018.05.15

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**1988 අංක 2 දරන පළාත් සභා ඡන්ද විමසීම් පනත**

බස්නාහිර පළාතේ පළාත් සභාවේ මන්ත්‍රී ධූරයක පුරප්පාඩු පිරවීම

බස්නාහිර පළාතේ පළාත් සභාවේ මන්ත්‍රීවරයෙකු මිය යාම හේතු කොටගෙන එම පළාත් සභාවේ මන්ත්‍රී ධූරයක පුරප්පාඩුවක් ඇති වී තිබෙන බව 1988 අංක 2 දරන පළාත් සභා ඡන්ද විමසීම් පනතේ 65(1) වැනි වගන්තිය යටතේ බස්නාහිර පළාතේ පළාත් සභාවේ ලේකම්වරයා විසින් මැතිවරණ කොමිෂන් සභාව වෙත දන්වා තිබෙන හෙයින් ද;

එකී පුරප්පාඩුව පුරවනු පිණිස තෝරා පත්කර ගත් මන්ත්‍රීවරයා අයත්ව සිටි පිළිගත් දේශපාලන පක්ෂය වන **ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂයෙහි** ලේකම්වරයාට ඉහත කී පනතේ 65 (2) වැනි වගන්තිය යටතේ සුදුසුකම් ඇති තැනැත්තෙකු නාමයෝජනා කරන ලෙස මැතිවරණ කොමිෂන් සභාව විසින් නියම කර ඇති හෙයින් ද;

ඉහත කී පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම්වරයා විසින් එකී පුරප්පාඩුව පුරවනු පිණිස **ජනක කුරුප්පු මහතා** නාමයෝජනා කර ඇති හෙයින් ද;

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ දහනව වැනි සංශෝධනයේ විධිවිධාන සමග කියවිය යුතු 1988 අංක 2 දරන පළාත් සභා ඡන්ද විමසීම් පනතේ 65 (2) වැනි වගන්තිය ප්‍රකාර ක්‍රියා කරමින්, **ජනක කුරුප්පු** මහතා එම පුරප්පාඩුව සිදු වූ ගම්පහ පරිපාලන දිස්ත්‍රික්කයේ ඉහත සඳහන් පළාත් සභාවේ මන්ත්‍රීවරයෙකු ලෙස තේරී පත් වී ඇති බව මැතිවරණ කොමිෂන් සභාව විසින් මෙයින් ප්‍රකාශ කරනු ලැබේ.

| | | |
|---|---|---|
| මහින්ද දේශප්‍රිය | එන්. ජේ. අබේසේකර | එස්. රත්නජීවන් එච්. හූල් |
| සභාපති | සාමාජික | සාමාජික |
| මැතිවරණ කොමිෂන් සභාව | මැතිවරණ කොමිෂන් සභාව | මැතිවරණ කොමිෂන් සභාව |

2018 මැයි මස 15 වැනි දින,
මැතිවරණ මහලේකම් කාර්යාලය,
සරණ මාවත,
රාජගිරිය.

06 - 83

1A - G 27632 — 27 (2018/05) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*